දැනුවත් කිරීමේ නිවේදන අංක 02

# කොටස් වෙළෙඳපොළ ආයෝජකයකු අමතක නොකළ යුතු දේ !

01. කොටස් වෙළෙඳපොලේ ආයෝජනය ප්‍රධාන වශයෙන් මධ්‍ය හා දිගුකාලීන ආයෝජනයක් බව වටහා ගැනීම.

02. කළින් කළ වෙනස්වන වෙළෙඳපොළ තත්වයන්ට සහ සමාගම්වල අපේක්ෂිත ඉපයුම් අනුව තමන්ගේ අවදානම දරාගැනීමේ සහ කළමනාකරණය කර ගැනීමේ හැකියාව පිළිබඳ නිසි තක්සේරුවකට එළඹීම.

03. වෘත්තීය ලියාපදිංචි ආයෝජන උපදේශකයකු පමණක් තම උපදේශනය සඳහා සහාය කර ගැනීම.නමුත් අවසන් ආයෝජන තීරණය ඔබ විසින්ම සිතා බලා ගත යුතුවේ.

04. උපායශීලී ආයෝජන සැලැස්මකට අනුව ආයෝජනය කිරීම.

- දේපල
- ස්ථාවර තැන්පතු
- විදේශ විනිමය
- භාන්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර
- වාණිජ පත්‍රිකා
- ඒකකභාර
- කොටස් වෙළෙඳපොල

ඔබගේ සියළු ධනය කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීම නොව, විවිධ ආයෝජන මාර්ගවල ආයෝජනය කිරීම ගැන අවධානය යොමු කරන්න.

05. කටකථා සහ හඬා යෑමකට ලක් නොවී ස්වාධීන මූලාශ්‍රවල තොරතුරු සසඳා තමන් විසින්ම සිදුකරන විශ්ලේෂණයකින් පසුව පමණක් ආයෝජන තීරණ ගැනීම.

06. සමපේක්ෂණ චේතනාව මත ගණුදෙනු වන කොටස් පිළිබඳව ඔබ නිරන්තර අවධානයෙන් පසුවිය යුතු අතර මූලිකතාවයන් සහ සමාගම් හී කාර්යසාධනය මත මිල තීරණය වන කොටස්වල ආයෝජනය කිරීමට වග බලා ගත යුතුය.

07. කෙටිකාලීන සහ ක්‍රියාශීලී වැඩිවාර ගණනක වෙළෙඳ නැඹුරුව තුළ අනවශ්‍ය ඉහළ අවදානමක් සහ ගණුදෙනු පිරිවැයක් දැරීමට සිදුවන බව අවබෝධ කර ගැනීම.

08. "අඩු මිලට මිලදී ගෙන වැඩි මිලට විකිණීම" යන කොටස් ආයෝජනයේ මූලික සිද්ධාන්තය පිලිබඳ නිරන්තර අවධානය යොමු කිරීම.

09. එක් කොටසකට හෝ සීමිත කොටස් ප්‍රමාණයක් මතම සීමා නොවී හොඳින් විවිධාංගීකරණය කළ"ආයෝජන කළඹක" දිගුකාලීනව ආයෝජනය කිරීම.

10. ඉවසිලිවන්තව, යථාර්ථරූපී වු අපේක්ෂාවන් මත කටයුතු කිරීම.

11. තම ආයෝජනයන් හා උපක්‍රමික සැළසුම් පිලිබඳ නිරන්තර සමාලෝචනයන් සිදුකිරීම.

12. යම් හෙයකින් ඉහත පරිදි සම්පව කටයුතු කිරීමට නොහැකි තරම් ඔබ කාර්ය බහුල නම්, ඔබ වෙනුවෙන් නිරන්තර සමාලෝචනයට ලක්වන විශාල ආයෝජන කළඹක් හරහා විවිධාංගීකරණය වෙමින් අවදානමට හොඳින් මුහුණ දෙන ඒකක භාර සමාගමක්/කළමනාකරුවකු සමඟ සාකච්ඡා කොට "ඒකක භාරයක" ආයෝජනය කිරීම.

***"ඔබේ ආයෝජන තීරණය සඳහා තොරතුරු මත කටයුතු කරන ඔබගේ බුද්ධියට ඉඩ දෙන්න"***


මූල්‍ය සේවා විද්‍යායතනය

*අධ්‍යයන හා පුහුණු අංශය*

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**

28,29 වන මහළ , නැගෙනහිර කුළුණ

ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය

එච්ලන් චතුරශ්‍රය

කොළඹ 01.

වෙබ් අඩවිය - www.sec.gov.lk සහ www.fsalanka.edu,lk


**සටහන ඃ-**

***කොටස් වෙළෙඳපොළ ආයෝජනයන් පිළිබඳව ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය වේ නම් අපගේ දීපව්‍යාප්ත දැනුවත් කිරීමේ වැඩසටහන් වලට සහභාගීවීම, ආයෝජක පාඨමාලාව හැදෑරීම හෝ කොළඹ කොටස් වෙළෙඳපොළෙන් විමසීම් කළ හැකියි.***